







ජගත් පේ එදිරිසිංහ ලියන

# තාරුකා විජිතය 3

එක් වරම නිෂාධි සිටි මේසය වෙත යන්නට නොහැකි බවක් අනුරාධ ට දැනුණි. ඔහු සිටි තැනම නැවතී ඇය දෙස බලා සිටියේ ය. මේ ඇයම ය. එක මොහොතකට තම සිත සසළ කළ ඇයම ය. ඔහු බොහෝ අපහසුවෙන් පියවර කීපයක් තබා ඇගේ මේසය ඉදිරියේ සිට ගත්තේ ය.

"නිෂාධි...." ඔහුගේ කටහඬ සැළෙන සුලු විය.

නිෂාධි සිටියේ කෑම පිඟානට හිස නැඹුරු කරගත් වන ම බොහෝ දුර කල්පනාවක ය. තේරුම් ගත නොහැකි කැළඹිල්ලක ඇය පැටලී සිටියා ය. අනුරාධගේ ආමන්ත්‍රණය ඇගේ සිත පියවි ලෝකයට ගෙනෙන්නට සමත් විය. ඈ හිස ඔසවා ඔහු දෙස බැලුවා ය. එක මොහොතකට ඔවුනගේ දෑස් එකට ගැටුණි. ඇගේ කාන්තිමත් දෑසේ රැඳුණ විශ්මය ඔහු වහා වටහා ගත්තේ ය. ඔහු සිනාසෙන්නට උත්සාහ දරමින් සිටියේ ය. ඈ වහා බිම බලා ගත්තා ය. දෙවන වර හිස ඔසවා බලන විටත් අනුරාධ තවම තමා දෙස බලා සිටිනු ඇය දුටුවා ය.

වාඩිවෙන්නදැයි අසන්නට ඔහුට ඇවැසි විය. එනමුදු ඔහු ඇසුවේ නැත. වාඩිවෙන්න යයි ඇය ආරාධනා කළේ ද නැ.ත.

ඔහු අනාරාධිතවම ඇය ඉදිරියේ වූ හිස් පුටුවේ වාඩි වූයේ ය.

අසන්නට බොහෝ දේ තිබුණ ද ඔහු කතාවකින් තොරව සිය සුප් පීරිසිය හැඳිගාමින් ඒ දෙස බලා සිටියේ ය.

"අපි.... අපි ආයෙ හමුවුණා නේද..?" අවසන නිහඬතාව බිඳ දමමින් ඔහු ඇසුවේ ය.

නිෂාධි පිළිතුරක් නොදුන්නා ය.

"පුදුමයි නේද..?" ඔහු නැවත ඇසුවේ ය. ඈ හිස ඔසවා ඔහු දෙස බැලුවා ය. පළමු වතාවට ඇගේ වුවේ සිනාවක් ඇඳුණි.

"පුදුමයක් නැහැ..." ඈ බොහෝ පහත් හඬකින් කීවා ය. "... ලෝකෙ බොහොම පුංචියි.."
ඔහුට සැහැල්ලුවක් දැනුණි.

"At last you replied..... ඇති යන්තම් කතා කළා.. මං හිතුවෙ කතා කරන එකක් නැහැයි කියලා.."
නිෂාධි නැවත සිනාසුණා ය. ඔහු මහත් වූ ලෝබකමකින් ඒ සිනහව විඳ ගත්තේ ය.

නිවාඩුවකටද ආවෙ...? ඔහු ඇසුවේ ය. ඇය ප්‍රශ්ණාර්ථයක් නැගුණ දෙනෙතින් ඔහු දෙස බැලුවා ය. ඔහු යමක් අනුමාන කර ඇති බව ඇය තේරුම්ගත්තා ය.

"නිවාඩුවකට ආවා නෙවෙයි.. නිවාඩුවකට එව්වා.." ඇය සිය කෑම පිඟානෙහි රැඳුන දෑසින් කීවා ය.

නියමයිනෙ.. වැඩ කරන තැනින්ද..? ඔහු වහා ඇසුවේ ය. නිෂාදි ඔහුගේ ප්‍රශ්නයට පිළිතුරක් නොදුන්නාය.

"අනුරාධ..." ඈ පළමු වරට ඔහු නමින් ඇමතුවා ය. ඒ ගීතවත් ආමන්ත්‍රණයෙන් ඔහු සිත පිබිදුණේ ය. ".....අද හවස ඔයා මුණගැහුණ වෙලාවෙ මං දැනං හිටියෙ නැහැ ඔයා ප්‍රසිද්ධ ඇක්ටර් කෙනෙක් කියලා.. ඇය පහත් හඬින් කීවා ය. .. ඒ වෙලාවෙ ඔයාව අඳුනන්නෙ නැහැයි කියලා මං කිව්වෙ ඇත්තටමයි.. I am sorry...".

"ගණන් ගන්න එපා.. මට තේරුණා.. " අනුරාධ කිවේ ය. ".. නිෂාධි අවුරුදු කීයකින්ද ලංකාවට ආවෙ..?"

"අවුරුදු පහකින්.. මං ඔස්ට්‍රේලියාවට ගියාට පස්සෙ ආව පළමුවෙනි පාර මේකයි.." ඈ සිය පිඟාන මත ඇඟිලි තුඩින් ඉරි ඇන්දා ය. හිස ඔසවා ඔහු දෙස බලන්නට හිතේ මහත් වූ ඕනෑකමක් තිබුණද නිෂාධි එය ආයාසයෙන් මැඩ ගත්තා ය. අවුරුදු පහක් යනු කොයිතරම් දිග කාලයක් ද.? හුදකලාවත් පාලුවත් අතර දිය කර හරිනු ලැබූ ඒ අවුරුදු පහ කොයි තරම් දිග වී ද?

"ඔස්ට්‍රේලියාව... කොච්චර දුර රටක් ද?" . අනුරාධගේ හඬ ඇයට ඇසුණි. "....එහෙම දුර රටකට වෙලා ඉන්නෙ කොහොමද..?"

නිෂාධි පිලිතුරක් නොදුන්නා ය. තමන්ටම ප්‍රශ්නයක් වූ ප්‍රශ්නයකට කෙසේ නම් පිළිතුරක් දෙන්න ද? හදවතට සමීප සියල්ල ලංකාවේ තිබියදී විදේශයකට වී සිත රටවාගනිමින් ගෙවන ව්‍යාජ ජීවිතය කොයි තරම් නීරස වීද?

"කෝ ඔයාලෙග යාලුවො..?" ඇගේ පිලිතුරක් අපේක්ෂාවෙන් බලා සිටි අනුරාධ නැවත ඇසුවේ ය.

ඈ හිස හරවා ඈත මේසයක සිටි පවිත්‍රාත්

*රාත්‍රිය පුරා සිරිපොද වැස්සක් ඇද හැලෙණු ඇය අසා සිටියා ය. කාලාන්තරයක් මුළුල්ලේ දිලීප කෙරෙහි සිය සිතේ ගොඩ නැගෙමින් පවතින අප්‍රසාදය වෙන කිසිම දාකට වඩා දැනෙන බවක් ඇයට හැගුණි.*